**ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය - 2016**

**------------------------------------------------------------**

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 5 දරන ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලීය පනතේ 21(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මාණ්ඩලික විද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000-1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 66,459,348 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෘදුකාංග පද්ධතියක් මිලදී ගැනීම වෙනුවෙන් අධිකාරිය විසින් ආරක්ෂක අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයක් වෙත සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ රු.මිලියන 4.5ක සම්පූර්ණ මුදල අත්තිකාරමක් ලෙස ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයේ වත්කම් මිලදී ගැනීමක් ලෙස සලකා ප්‍රාග්ධනිත කර තිබුණ ද ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) විදේශ ශිෂ්‍ය නිලධාරීන් සඳහා පවත්වනු ලැබූ පාඨමාලාවන් සඳහා 2015 වර්ෂය තුළදී මාණ්ඩලික විද්‍යාලය වෙත ලැබී තිබුණු රු.10,645,740 ක මුදල එම වර්ෂයේ විලම්භිත ආදායමක් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. එම මුදල උපයෝජනය කර සමාලෝචිත වර්ෂයේදී රු.381,000 ක් වටිනා යතුරු පැදියක් මිලදී ගෙන තිබුණු අතර, රු.5,103,350 ක් නිලධාරී නිවස්තය වැඩි දියුණු කිරීම සඳහා වැයකර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා එම වත්කම් වලට අදාල රු.178,267 ක් වූ ක්ෂය වීම්, ක්‍රමක්ෂය ලෙස සලකා ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී භාවිතයෙන් ඉවත් කර තිබුණු පිරිවැය රු.117,000 ක් වූ යතුරු පැදි දෙකක් , පිරිවැය රු.160,000 ක් වූ ත්‍රීරෝද රථයක් සහ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලෙස සලකා ඉවත් කර තිබුණු ලී බඩු, පරිගණක, විදුලි උපකරණ යනාදි වත්කම් විෂයයන් 60 ක පිරිවැය හා ඊට සම්බන්ධිත සමුච්චිත ක්ෂය ප්‍රමාණය ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි.

(ඈ) විද්‍යාලය සතු නොවන යුධ හමුදාව වෙත නැවත භාරදී ඇති පිරිවැය රු.77,500 ක් වූ යතුරු පැදි දෙකක් විද්‍යාලයේ වත්කම් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා තිබුණි.

(ඉ) පරිත්‍යාග වශයෙන් යුධ හමුදාව විසින් විද්‍යාලය වෙත ලබා දුන් ට්‍රැක්ටර් ට්‍රේලරයක් සහ වතුර බවුසර් ට්‍රේලරයක් වත්කම් ලෙස පැවති නමුත් එහි වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගත් රු.2,323,809 ක පුස්තකාල පොත් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) ශ්‍රී ලංකා යුධ හමුදාව වෙතින් සමාලෝචිත වර්ෂයේදී ඉන්ධන වියදම් ප්‍රදාන ලෙස ලැබුණු රු.11,097,151 ක් වෙනුවට රු.11,200,000 ක් ගිණුම්ගත කිරීම නිසා ඉන්ධන වියදම් හා ප්‍රදාන රු.102,849 කින් වැඩියෙන් පෙන්වා තිබුණි.

(ඌ) ඵලදායී ජීව කාලය ඉක්මගොස් තිබූ ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සඳහා ඉකුත් වර්ෂයේදී සාවද්‍ය ලෙස ගිණුම්ගත කරන ලද රු.2,401,072 ක් වූ ක්ෂයවීම් නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

(එ) 2016 දෙසැම්බර් 31 දිනට විදුලි බිල් සඳහා ගෙවිය යුතුව පැවති රු.1,169,373 ක ප්‍රමාද ගාස්තු ගිණුම්වලට ගෙන නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, ස්ථාවර වත්කම් ලෙජර් ගිණුම් සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා මෝටර් වාහන ක්ෂයවීම්වල රු.1,480,000 ක වෙනසක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගොඩනැගිලි වටිනාකම රු.909,467,108 ක් වුවද ස්ථාවර වත්කම් ලේඛනයේ එම වටිනාකම රු.909,685,080 ක් වූයෙන් රු.217,972 ක වෙනසක් විය.

**2.3 ගෙවිය යුතු මුදල්**

------------------

විද්‍යාලයට ඉන්ධන සැපයීම වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට යුධ හමුදාව වෙත ගෙවිය යුතු රු.10,992,853 ක ණය ශේෂය දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කර තිබුණු අතර එම ණය ශේෂය පියවීමට විද්‍යාලය විසින් කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 වගන්තිය ප්‍රකාරව අයවැයගත ආදායම් වියදම් ප්‍රකාශය, අයවැයගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනයට ඇතුලත් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,665,356 ක ඌනතාවයක් වු අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.15,135,982 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 20,801,338 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව පාඨමාලා ගාස්තු අයකිරීමේ පදනම මත කිසිදු විදේශ ශිෂ්‍ය නිලධාරියෙකු ප්‍රවර්තන වර්ෂයේදි සහභාගී නොවීම හේතුවෙන් වෙනත් ආදායම් ජනනය වී නොතිබීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු.6,410,036 ක්ව පැවති විද්‍යාලයේ ඌනතාවය 2015 වර්ෂයේදී රු.15,135,982 ක අතිරික්තයක් වී තිබුණද සමාලෝචිත වර්ෂයේ දී නැවත රු.5,665,356 ක ඌනතාවයක් විය. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමේදී 2012 වර්ෂයේ රු.21,827,028 ක්ව පැවති විද්‍යාලයේ දායකත්වය 2015 වර්ෂයේදී රු.57,051,011 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණ ද 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී රු. 39,964,731 ක් ලෙස අඩු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2008 අංක 5 දරන ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාල පනත ප්‍රකාරව සන්නද්ධ හමුදාවල නිලධාරීන්ට පත්වීම් හා උසස්වීම් සඳහා ඔවුන්ට අවශ්‍ය වෘත්තීය දැනුම ලබා දීම හා මාණ්ඩලික විද්‍යාලයේ පුහුණුව ලබන නිලධරයින් අණ හා මාණ්ඩලික කර්තව්‍ය යන අවස්ථා දෙකෙහිම ඵලදායීව ක්‍රියාකිරීම සඳහා සූදානම් කිරීම විද්‍යාලයේ මූලික අරමුණු වේ.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

හෙයියන්තුඩුව තරුණ සේවා සභාවට අයත් භූමියෙන් අක්කර 11 ක ඉඩම් ප්‍රමාණයක් 2011 වර්ෂයේදී මාණ්ඩලික විද්‍යාලය වෙත ලබා දී ඇතත් නීත්‍යානුකූලව එහි හිමිකම පවරා ගැනීමට 2016 දෙසැම්බර් 31 දින තෙක් කටයුතු කර නොතිබුණි. තවද, මාණ්ඩලික විද්‍යාලයේ කටයුතු සඳහා යොදාගනු ලබන වාහන අතුරින් ආරක්ෂක අමාත්‍යාංශයට අයත් පිරිවැය රු.4,400,000 ක් වූ බස්රථය හා යුධ හමුදාව වෙතින් ලබාදී තිබුණු පිරිවැය රු.28,275,000 ක් වූ වෙනත් වාහන 16 ක් මාණ්ඩලික විද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------

ජනාධිපති ලේකම්ගේ 2013 ජුනි 05 දිනැති අංක පීසීඑම්ඩී/පීආර්/**2013** ලිපිය අනුව රාජ්‍ය ආයතන වල ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ අපහරණය කිරීමට හෝ වෙන්දේසි කිරීමට හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව අපහරණ ක්‍රියාවලිය සඳහා ඔරුවල වානේ සංස්ථාවට භාරදීමට කටයුතු කළ යුතුව තිබුණි. මාණ්ඩලික විද්‍යාලය සතු යතුරු පැදි 2 ක් වසර තුනකට අධික කාලයක සිට ධාවනයෙන් ඉවත් කර මාණ්ඩලික විද්‍යාල පරිශ්‍රය තුල ගාල්කර දිරාපත් වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

-----------------------------

2012 අංක 13 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය (සංශෝධිත) පනතේ 22(2) වගන්තිය අනුව විද්‍යාලයේ ගණකාධිකාරී තනතුර සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු පත්කල යුතු වුවත්, 2015 වර්ෂයේ පුරප්පාඩු වූ එම තනතුරට 2017 මාර්තු 31 දින වන විටත් එම සේවයේ නිලධාරියෙකු පත්කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. තවද පනත ප්‍රකාරව මාණ්ඩලික විද්‍යාලයේ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය වන මහාචාර්ය පදවි, ආචාර්ය පදවි හා වෙනත් තනතුරු ඇති කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක්ම අධ්‍යයන කාර්ය මණ්ඩලයේ එම උසස් තනතුරු සඳහා පත්කිරීම් සිදුකර නොතිබුණි.

**4.5 කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

--------------------------

භාණ්ඩ වල ප්‍රමිතිය හා ගුණත්වය පිළිබඳව සැලකිලිමත් වීමකින් තොරව හා ගිවිසුම් ප්‍රකාරව නිසිපරිදි නියමිත කාර්යය ඉටුවී නොතිබියදී මාණ්ඩලික විද්‍යාලයේ නිල නිවාස ගොඩනැගිල්ල වෙනුවෙන් ඇළුමිනියම් හා දැව උපාංග සවිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකු වෙත සමාලෝචිත වර්ෂයේ දී රු.6,327,877 ක මුදලක් ගෙවා තිබුණි. මෙම භාණ්ඩ වල ගුණත්වය පරීක්ෂා කිරීම සඳහා පත්කරන ලද සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුවද ඒවා නිසි ගුණත්වයෙන් හා ප්‍රමිතියෙන් නොමැති බව තවදුරටත් අනාවරණය විය.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

----------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව මුදල් වර්ෂය අවසාන වී දින 60ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2017 මාර්තු 23 වන දිනදීය**.**

**5.2 ක්‍රියාකාරි සැලැස්ම**

------------------

2016 වර්ෂයේ මාණ්ඩලික විද්‍යාලය විසින් සකස් කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ විද්‍යාලයේ ප්‍රාග්ධන වියදම් හා ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා දැරීමට අපේක්ෂිත වියදම් ඇතුලත් කර තිබුණු නමුත් එම වත්කම් ශිෂ්‍ය නිළධාරීන්ගේ අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාම ඇතුළු අනෙකුත් ප්‍රධාන අරමුණු වලට අදාල කරගන්නා ආකාරය පිළිබඳ තොරතුරු ඇතුලත් කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

2012 අංක 13 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනතේ 21 (2) වගන්තිය අනුව මාණ්ඩලික විද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය සඳහා ස්ථිර අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විද්‍යාලයේ සේනාවිධායකගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
| --- | --- | --- |
| (අ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | i. | භාණ්ඩ මිලදී ගැනීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයට අනුව කටයුතු නොකිරීම. |
| | ii. | කුලී පදනම මත වාහන ලබාගැනීමේදී මිල ගණන් ඉදිරිපත් කර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලද සැපයුම්කරුවන් හා කුලී ගිවිසුම් ඇතිකර ගත් පාර්ශව අතර වෙනස්කම් පැවතීම. |
| (ආ) අභ්‍යන්තර විගණනය | | විධිමත් අභ්‍යන්තර විගණනයක් සිදු නොකිරීම. |
| (ඇ) ගිණුම්කරණය | | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබීමට කටයුතු නොකිරීම. |